**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙනයා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය හා අත්පොත. | මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම අයවැය ලේඛනයට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුමත කිරීම මාස 02 ක ප්‍රමාදයකින් සිදුවී තිබුණි . | 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම, ප්‍රසම්පාදන සැළැස්ම හා අයවැය ලේඛනය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් අනුව සංශෝධනය කර 2024 පෙබරවාරි 22 දින ලේකම්ගේ අනුමැතිය ලබා දී ඇත. 2026 වර්ෂය සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | මුදල් පනත හා අදාල මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 502 (2) ll වන පරිශිෂ්ඨය සහ අංක 842 දරන 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය.<br>(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය. | 2024 දෙසැම්බර් මස සිදු කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනයේදී වත්කම් රු.5,561,348 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද, චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කරන ලද ස්ථාවර වත්කම් ඇතුළත් කර නිසි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව සටහන් කර පවත්වා ගැනීමට කටයුතු කරන බව දක්වා තිබුණි . | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (i) 2.3 ඡේදය. | 2022 සිට 2024 වර්ෂය දක්වා වූ වසර තුනකට සංයුක්ත සැලැස්ම සකස් කර තිබුණු අතර ඉදිරි වර්ෂ 5 සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂය සඳහා අදාළ මාර්ගෝපදේශ අනුව සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | අදාල මාර්ගෝපදේශ අනුව සංයුක්ත සැලැස්ම පිළියල කළ යුතුය. |
| (ඇ) අංක 01/2017 දරණ 2017 ජුනි 28 දිනැති වත්කම් | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවෙහි රු.මිලියන 5.6 ක් වටිනා වත්කම් මුදල් | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වත්කම් අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ රජයේ වත්කම් පිළිබඳ මධ්‍යගත දත්ත පද්ධතියට ඇතුළත් | අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය . |

| | | |
|---|---|---|
| කළමනාකරණ චක්‍රලේඛය . | අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ රජයේ වත්කම් පිළිබඳව මධ්‍යගත දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි . |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.109,945,502 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.132,698,295 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,752,793 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයෝජන ආදායම රු.38,200,010 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 දෙසැම්බර් 12 වන දිනැති පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 351 හි 10.6 වගන්තිය අනුව රටේ මාර්ග ආරක්ෂාව වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා මෙම ආයතනය ජාතික කොමිෂන් සභාවක් බවට පත් කර ඊට අවශ්‍ය බලතල, අධිකාරිය හා මූල්‍ය සම්පත් ලබා දීම, කොමිෂන් සභාවේ කටයුතු වලට සහය වීම සඳහා අවශ්‍ය සියලු අංගෝපාංග වලින් හා ඉහළ සුදුසුකම් සහිත පුහුණුවලත් කාර්යමණ්ඩලයකින් සමන්විත පූර්ණ ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම කළයුතු වුවද , එසේ කටයුතු කර නොතිබුණි. | සභාව, ප්‍රවාහන සුරක්ෂා කොමිෂන් සභාව ලෙස ස්ථාපිත කිරීමේ කටයුතු මෙතෙක් අවසන් කර නොමැති අතර, මේ සඳහා වන නීති කෙටුම්පත අවසන් වරට 2025 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | ප්‍රවාහන සුරක්ෂා කොමිෂම අදාල අනුමැතීන්ට යටත්ව ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) “සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්” යන තේමාව යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අපේක්ෂිත කාර්යයන් 11 ක් සඳහන් කර තිබුණද, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ රිය අනතුරු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව පසුගිය වසර පහ තුළ සිදුව ඇති සමස්ත වාහන අනතුරු සංඛ්‍යාව | මාර්ග අනතුරු අවම කිරීම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකාව තුල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් කටයුතු කරන බවත්, මාර්ග අනතුරු ඉහළයාමට විවිධ හේතු බලපාන බවත්, මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන වෙත බලපෑම් කිරීමේ හා නියාමනය කිරීමේ බලයලත් ආයතනයක් | ප්‍රමුඛ අවශ්‍යතා හඳුනා ගනිමින් මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් දීප ව්‍යාප්තව පුළුල් ලෙස |

| | | |
|---|---|---|
| 116,167 ක් බවත් එයින් පුද්ගලයන් 12,149 කට ආසන්න සංඛ්‍යාවක් මිය ගොස් තිබුණු බවත් වාර්තාවී තිබුණි. එමෙන්ම පසුගිය වසර තුන තුළ සභාව විසින් මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් සඳහා රු.64,500,752 ක වියදමක් දරා තිබුණද ,මාර්ග අනතුරු සංඛ්‍යාවේ අඩුවීමක් වී නොතිබුණි. | ලෙස මෙම සභාව ස්ථාපිත වී නොමැති බවත්, කෙසේ නමුත් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට දිගුකාලීන ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරයට ඉදිරියේදී ද සුදුසු ප්‍රායෝගික වැඩසටහන් සැළසුම්කර ක්‍රියාත්මක කරන බවත් දක්වා තිබුණි. | ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) හප්පා පලා ගිය අනතුරු හේතුවෙන් අසරණ වන පුද්ගලයන්ට වන්දි ලබාදීමට අදාලව පසුගිය වසර පහක කාලය තුල හප්පා පලාගිය අනතුරු 1169 කින් වන්දි ලබා ගැනීම සඳහා සභාව වෙත අයදුම්පත් 247 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි. මෙම හප්පා පලාගිය අවස්ථාවන්හිදී ඒ සඳහා වන්දි ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම, මෙම වන්දි ඉල්ලීම් අවම වීමට හේතු වී තිබුණි. | සභාව මඟින් හප්පා පලාගිය රිය අනතුරු වලින් අගතියට පත්වන පුද්ගලයන්ට මූල්‍ය සහන ලබා දුන්නද, සියලුම වින්දිතයින් සභාව වෙතින් මූල්‍ය සහන ඉල්ලුම් නොකරයි. මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරන ලෙස ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් ස්ථාන දැනුවත් කර ඇති අතර පොදු ජනතාව දැනුවත් කිරීමට මෙම වසරේදී කටයුතු කරන බව දක්වා තිබුණි. | හප්පා පලාගිය අනතුරු වලට වන්දි ලබාගැනීමේ හැකියාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය ඇතුළුව වසර තුනක් තුළ සභාවට රක්ෂණ ආයතන වෙතින් ලද රු.222,674,418 ක ආදායමින් මූල්‍ය සහන ලබා දීමේ කටයුතු සඳහා හා මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැයකර තිබූ රු.100,450,751 ක් එනම් සභාවේ ආදායමින් සියයට 45 ක් පමණක් විය. ආයතනයේ ස්ථාපිත කාර්යභාරය ඉටුකිරීම සඳහා සුදුසු කාර්යක්ෂම සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබීම, මාර්ග ආරක්ෂණ හා මූල්‍ය සහන ලබාදීමේ වියදම් අවම වීමට හේතු වී තිබුණි. | 1998 අංක 5 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතේ 213 (ආ) හි 4 මගින් මාර්ග ආරක්ෂණ අරමුදලේ කාර්යභාරය දක්වා ඇත. පසුගිය වසර දෙක ඇතුළත අත්‍යාවශ්‍ය තනතුරු වරින් වර හිස්ව පැවතීම හේතුවෙන් ඇතැම් සැලසුම් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. ඉදිරියේදී වැඩසටහන් සැළසුම් කර නියමිත කාලරාමු තුලදී ක්‍රියාත්මක කර ආයතනයේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරන බව දක්වා තිබුණි. | ආයතනයේ ස්ථාපිත කාර්යභාරය ඉටුවන පරිදි සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාවේ ලේකම් තනතුර, සංවර්ධන නිළධාරී තනතුරු 4 ක්, කළමනාකරණ සේවා නිලධාරී තනතුරක්, කාර්යාල කාර්ය සහායක තනතුරක්, රියදුරු තනතුරු 2 ක්, මෙහෙයුම් නිලධාරී තනතුරක් වශයෙන් තනතුරු 6 කට අදාලව කාර්යමණ්ඩලය 10 ක් සඳහා කළමනාකරණ සේවා | සභාව සඳහා සංවර්ධන නිලධාරීන් 5 දෙනෙකු අනුමත කරන අවස්ථාව වන විටත් අමාත්‍යාංශයෙන් හා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු, කළමණාකරණ සේවා නිලධාරියෙකු, රියදුරන් දෙදෙනෙකු හා කාර්යාල සහයකවරයෙකු සේවය | අනුමත තනතුරු සඳහා ස්ථිර වශයෙන් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ප්‍රවාහන අමාත්‍යාංශයේ හා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයෙන් සභාවට අනුයුක්ත කර තිබුණි. | කර ඇතත් මෙතෙක් ඉහත අනුමත තනතුරු සඳහා ස්ථිර කාර්යමණ්ඩලය පත් කර නොමැති බව දක්වා තිබුණි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.2.1 ඡේදය ප්‍රකාරව ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ ප්‍රමුඛතා පදනම්ව සංයුක්ත සැලැස්ම හරහා උපාය මාර්ගික දිශානතිය සකස් කරනු ලැබීමටත්, එමඟින් අර්ථ දක්වා ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) ක්‍රියාත්මක වන බව සහතික කරගැනීමත්, උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සමාලෝචනය කර අවශ්‍ය ඕනෑම අවස්ථාවක නිවැරදි කිරීමේ පියවර ගැනීමත්, ආයතනයේ කළමනාකරණයේ වගකීම වුවද, 2022 - 2024 තුන් අවුරුදු සංයුක්ත සැලැස්මේ ප්‍රගතිය කළමනාකරණය විසින් කාලීනව සමාලෝචනය කිරීමට හෝ යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2025 වර්ෂයේ සිට ඉදිරි අවුරුදු 5 ක කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම ජාතික සභාවේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී වරින්වර ආයතනයේ කළමනාකාරිත්වයේ සිදුවූ පුරප්පාඩු හේතුවෙන් 2024 වර්ෂයේ අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගැනීමට අපොහොසත් වී ඇති බව හා 2022 - 2024 සංයුක්ත සැලැස්මද මනා පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොමැති බවත් තහවුරු කරන අතර ඉදිරියේදී මෙවැනි ගැටළු ඇතිවීම වළක්වා ගැනීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) එක්සත් ජාතීන්ගේ මාර්ග ආරක්ෂණ සහයෝගිතාව පිළිබඳ ප්‍රවේශය පදනම් කරගෙන, ව්‍යාපෘති 32 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 476.1 ක අයවැයගත ප්‍රතිපාදනයක් සහිතව 2022-2024 තුන් අවුරුදු සංයුක්ත සැලැස්ම සභාව විසින් සකස් කර තිබුණි. සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් ව්‍යාපෘති 16 ක් එම කාලපරිච්ඡේදයන්හි ක්‍රියාකාරී සැලැසුම්වලට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර අනෙකුත් ව්‍යාපෘති 16 හි කාර්යසාධනය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සියයට 0 සිට 81 අගයක් පමණක් ගෙන තිබුණි. එමෙන්ම මෙම තුන් අවුරුදු සැලැස්ම තුළ හඳුනානොගත් රු. මිලියන 82 ක් වටිනා ව්‍යාපෘති 33 ක් සංයුක්ත සැලැස්ම සංශෝධනය කිරීමකින් තොරව එම කාලපරිච්ඡේදයේ ක්‍රියාකාරී සැලසුම්වලට ඇතුළත් කිරීමටද කටයුතු කර තිබුණි. එමෙන්ම 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ව්‍යාපෘති 29 ක් යටතේ වැඩසටහන් 93 ක් හඳුනාගෙන තිබුණු අතර 2024 ජුනි මාසයේදී එය නැවත සංශෝධනය කර ව්‍යාපෘති 14 ක් යටතේ වැඩසටහන් 37 ක් රු. මිලියන 149 ක ඇස්තමේන්තුවකට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද , ඉන් ව්‍යාපෘති 11 ක් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණ අතර ඒවායේ කාර්යසාධනය සියයට 0 සිට 25 දක්වා අගයක් පමණක් ගෙන තිබුණි. | එක්සත් ජාතීන්ගේ මාර්ග ආරක්ෂණ සහයෝගීතාව විසින් යෝජිත කුළුණු 5ක ප්‍රවේශය යටතේ කටයුතු කිරීම අනිවාර්ය නොවුනද, සාමාජිකත්වය දරන රටක් වශයෙන් එම ප්‍රවේශය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අනතුරු අවම කිරීමට හේතුවන බව හඳුනාගත් බැවින්, ශ්‍රී ලංකාව තුළ මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවා ඇති වගකිවයුතු රාජ්‍ය ආයතනයක් ලෙස මෙම ප්‍රවේශය යටතේ වැඩසටහන් සැළසුම් කරනු ලබන බව හා සියලුම කුළුණු ආවරණය වන පරිදි වැඩසටහන් සකස් නොකිරීමට මෙම ජාතික සභාවේ පවතින නීතිමය තත්ත්වය හා සීමිත සම්පත් ප්‍රමාණය බලපාන බව දක්වා තිබුණි. | ආයතනයේ අරමුණු ඉටු වන පරිදි උපායක්‍රමික වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු වටිනාකම රු.233,597,000 ක් වූ අතර තත්‍ය වියදම රු.5,692,193 ක් එනම් සියයට 2 ක් පමණක් වීමෙන් සභාව විසින් සිය කාර්යභාරය ඉටු කිරීමේදී කාර්යක්ෂම ලෙස අරමුදල් භාවිතය සඳහා අයවැය ලේඛනය මනා පාලන කාරකයක් ලෙස භාවිතයට ගෙන නොතිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම් අවම භාවිතය සභාවේ අරමුණු හා කාර්යභාරය ඉටුකිරීමේදී ඉතා දුර්වල මට්ටමක් ඇති කිරීමටත්, මාර්ග අනතුරු අවම කර ගැනීමට නොහැකි වීමටත් හේතු වී තිබුණි. | 2025 වර්ෂයේ දී අයවැය ලේඛනය මනා පාලන උපකරණයක් ලෙස භාවිතා කිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි. | ආයතනික කාර්යභාරය ඉටු කිරීමේදී අයවැය ලේඛනය මනා පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |